8 ශ්‍රේණිය

# මෙත් සිත සව් සත කෙරෙහි කරන්නේ


21

❖ නිපුණතාව - සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි .

- නිපුණතා මට්ටම - පොත පත පරිශීලනයෙන් සාරධර්ම වර්ධනය කර ගනියි .

❖ නිපුණතාව - භාෂාත්මක කාර්යයේදී වාක්කෝෂය , භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි .

- නිපුණතා මට්ටම - වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි .



# ක්‍රියාකාරකම - 1

➢ ***ලෝවැඩ සඟරාව ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සොයා ලියන්න .***

1. ලෝවැඩ සඟරාව කුමන කාව්‍ය ගණයකට අයත් වෙයි ද ?
2. මෙම ග්‍රන්ථය ලිවීමේ අරමුණ කුමක් ද ?
3. මෙහි කතුවරයා නම් කරන්න .
4. ලෝවැඩ සඟරාව රචනා කරන ලද යුගය නම් කරන්න .
5. මෙමගින් අපට ලබා දෙන උපදේශමොනවා ද ?
6. ලෝවැඩ සඟරාව රචනා කිරීමේදී කතුවරයා විසින් යොදා ගෙන ඇති භාෂා උපක්‍රම මොනවා ද ?
7. ලෝවැඩ සඟරාව ලියැවී ඇති ආකෘතිය කුමක් ද ?
8. මෙය රචනා කරන ලද කතුවරයා විසූ පිරිවෙණ නම් කරන්න .
9. ලෝවැඩ සඟරාව රචනා කරන ලද කතුවරයාගේ වෙනත් කෘති නම් කරන්න .
10. ලෝවැඩ සඟරාවෙන් ඔබ පාඩමට අන්තර්ගත වී ඇති කවි සංඛ්‍යාව කොපමණ ද ?

**සරල බස් වහර සහ උපමා රූපක, උපදේශ , දහයයි , කවි ලකුණු මිණි මල , ලෝවැඩ පිණිස එනම් ලෝකයෙහි යහපත අරමුණු කර ගෙන , බුදු ගුණ අලංකාරය ජීවිතය හැඩ ගැස්වීමට අදාළ ,සිව්පද වීදාගම මෛත්‍රේය හිමි , දහම්ගැට මාලාව , වීදාගම ශ්‍රී ඝනානන්ද , කෝට්ටේ**

# ක්‍රියාකාරකම - 2

- ***යා කරන්න***

| | |
|---|---|
| මෙත් සිත | යමක හොඳ නරක කියා දී තේරුම් කිරීම |
| සව් සත | ලෝකයට යහපත |
| ලෝ වැඩ | ඇදගැනීම |
| උපදේශ | මෛත්‍රී සිතුවිල්ල |
| ජනනය | භික්ෂු අධ්‍යාපන ආයතනය |
| උපමා | පොත් |
| රූපක | ඉපදවීම |
| ආකර්ෂණය | යමක් තවත් දෙයකට සමාන කිරීම |
| පිරිවෙණ | යම් දෙයක් වෙනත් දෙයක් වගේ නොව එය ම යැයි දැක්වීම |
| ග්‍රන්ථ | සියලු සතුන් |

# ක්‍රියකාරකම - 3

➢ ***පහත දැක්වෙන උපදේශයන් ලබා දෙන කවියේ මුල් පදය සොයාගෙන සම්පූර්ණ කවියම ලියන්න .***

1. සිත , කය හා වචනය යන තුන්දොරින් පවක් සිදු වීමට ඉඩක් නොතබන්න .
2. අයහපත් දේවල් කරමින් ජීවත් වනවාට වඩා ධාර්මික යහපත් දේ කර මිය යාම වටී .
3. බුදු බණ විශ්වාස නොකොට අපායේ වැටි දුක් විඳ විනාශ වීමට උත්සහ කරන්න එපා .
4. පංචේන්ද්‍රියන් වැරදි ලෙස පිනවීමට නොපෙලඹෙන්න
5. විහිළුවටවත් සොරකමක් නොකරන්න .

**කෙළියට කඩක් සඟවා යහළුවකු ගෙනේ**

**කරන කලට පව් මීරි ය මී සේ**

**ළිප ගිනි මොළොවන තෙක් දිය සැළියේ**

**අදමින් ජීවත් වෙනවා විතරට**

**ගඟ වතුරෙහි යන මිනිසකු දුකිනේ**

# ක්‍රියාකාරකම - 4

➢ ***පහත A තීරුවේ දක්වා ඇති අදහසට ගැළපෙන කවිවල අතුළත් පද B තීරුවෙන් තෝරා ලියන්න .***

**A**

1. දිව්‍ය ලෝකය ------------------------------------------------------------
2. අන් අය වෙනුවෙන් කරන කටයුතු ---------------------------------------
3. මිහිරි වෙයි -------------------------------------------
4. සිත , කය , වචනය ----------------------------------
5. අධර්මිෂ්ට වී -------------------------------------------------
6. සිතේ ඇතිවන කුතුහලයෙන් ---------------------------------------
7. දරුණු -----------------------------------------------
8. අපායට ගොස් -----------------------------------------------
9. වර්ණනා කරන -------------------------------------------------
10. දෙව් වුවත් -------------------------------------------------------

**B**

1. අපායට ගොස්
2. දිව්‍ය ලෝකයක දෙව් කෙනෙකු වී ඉපදුණත්
3. සිතේ ඇතිවන කුතුහලයෙන්
4. අදමින්
5. ගොර
6. වැනුවා නම්
7. සග
8. මීරිය
9. තුන් දොර
10. කුහුල් සිතින්

# ක්‍රියාකාරකම - 5

➢ ***විරුද්ධ පද සොයා ලියන්න***

1. අඳුරෙහි ----------------------
2. සැප -----------------------------
3. නො කළොත් -------------------------
4. කරන කලට ------------------------------
5. සැබැවින්--------------------------------
6. කුසල් ------------------------------------
7. සතුරන් ---------------------
8. දුගතියෙ -----------------------------
9. පරලොව -------------------------------
10. නො කරවු -------------------------------

- **සුගතියෙ**
- **අකුසල්**
- **කරවු**
- **එළියෙහි**
- **මෙලොව**
- **දුක**
- **මිතුරන්**
- **කළොත්**
- **බොරුවෙන්**
- **නොකරන කලට**

# ක්‍රියාකාරකම - 6

➢ ***සුදුසු විරුද්ධ පදය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න .***

1. උදයට **විකසිත** වන මල් හවසට ------------------- වේ .
2. අපි ගඟෙන් **එගොඩට** ගොස් පසුවදා -------------------------- ආවෙමු .
3. වර්තමානයේ **ස්ථාවර** දූරකථනවලට වඩා ------------------------------ දූරකතන ජනප්‍රිය වී ඇත .
4. **දුසිරිත්** ක්‍රියාවලින් ඈත් වී ------------------------- ක්‍රියා කොට ආදර්ශමත් විය යුතුයි .
5. **අහංකාර** ස්ත්‍රිය ----------------------------- ස්ත්‍රිය දෙස රාවා බැලුවා ය .
6. ජීවිතයේදී **අවශ්‍ය** දෑ ළඟ තබාගෙන ----------------- දෑ ඉවත් කළ යුතුය.
7. **උත්තම** මිනිසුන් හමුවේ ---------------------- මිනිස්සු කම්පාවට පත්වෙති .
8. ඕනෑම දෙයක සාර්ථක **ආරම්භය** සාර්ථක ---------------------- පිළිබිඹු කරයි .
9. **මිතුරෙකුට** තබා -------------------------වත් මෙවැනි දුකක් අත් නොවේවා !
10. **බහුශ්‍රැත** මිනිසුන් මෙන්ම -------------------- මිනිසුන් ද අප අතර සිටියි .

**අල්පශ්‍රැත , සතුරෙකුට , මුකුළිත , අනවශ්‍ය, අධම , සුසිරිත් , නිරහංකාර , අවසානය , ජංගම , මෙගොඩ**

# ක්‍රියාකාරකම - 1
# පිළිතුරු



1 .උපදේශ

2. ලෝවැඩ පිණිස එනම් ලෝකයෙහි යහපත අරමුණු කර ගෙන

3. වීදාගම මෛත්‍රේය හිමි

4. කෝට්ටේ

5. ජීවිතය හැඩ ගැස්වීමට අදාළ

6. සරල බස් වහර සහ උපමා රූපක

7. සිව්පද

8. වීදාගම ශ්‍රී සනානන්ද

9. කව් ලකුණු මිණි මල , බුදු ගුණ අලංකාරය , දහම් ගැට මාලාව

10. දහයයි

# ක්‍රියාකාරකම - 2
# පිළිතුරු



| | |
|---|---|
| මෙත් සිත | යමක හොඳ නරක කියා දී තේරුම් කිරීම |
| සව් සත | ලෝකයට යහපත |
| ලෝ වැඩ | ඇදගැනීම |
| උපදේශ | මෛත්‍රී සිතුවිල්ල |
| ජනනය | භික්ෂු අධ්‍යාපන ආයතනය |
| උපමා | පොත් |
| රූපක | ඉපදවීම |
| ආකර්ෂණය | යමක් තවත් දෙයකට සමාන කිරීම |
| පිරිවෙණ | යම් දෙයක් වෙනත් දෙයක් වගේ නොව එය ම යැයි දැක්වීම |
| ග්‍රන්ථ | සියලු සතුන් |

# ක්‍රියකාරකම - 3
# පිළිතුරු



කරන කලට පව් මීරි ය මී සේ

අදමින් ජීවත් වෙනවා විතරට

ගඟ වතුරෙහි යන මිනිසකු දූකිනේ

ළිප ගිනි මොළොවන තෙක් දිය සැළියේ

කෙළියට කඩක් සඟවා යහළුවකු ගෙනේ

# ක්‍රියාකාරකම - 4
# පිළිතුරු



1. දිව්‍ය ලෝකය **සග**
2. අන් අය වෙනුවෙන් කරන කටයුතු **පර වැඩ**
3. මිහිරි වෙයි **මීරිය**
4. සිත , කය , වචනය **තුන් දොර**
5. අධර්මිෂ්ට වී **අදමින්**
6. සිතේ ඇතිවන කුතුහලයෙන් **කුහුල් සිතින්**
7. දරුණු **ගොර**
8. අපායට ගොස් **දුගතියේ වැද**
9. වර්ණනා කරන **වැනුවා නම**
10. දිව්‍ය ලෝකයක දෙවි කෙනෙකු වී ඉපදුණත් **දෙවි වුවත්**

# ක්‍රියාකාරකම - 5
# පිළිතුරු



1. අඳුරෙහි **එළියෙහි**
2. සැප **දුක**
3. නො කළොත් **කළොත්**
4. කරන කලට **නොකරන කලට**
5. සැබැවින් **බොරුවෙන්**
6. කුසල් **අකුසල්**
7. සතුරන් **මිතුරන්**
8. දුගතියෙ **සුගතියෙ**
9. පරලොව **මෙලොව**

- නො කරවු **කරවු**

# ක්‍රියාකාරකම - 6
# පිළිතුරු



1. උදයට **විකසිත** වන මල් හවසට **මුකුළිත** වේ .
2. අපි ගඟෙන් **එගොඩට** ගොස් පසුවදා **මෙගොඩ** ආවෙමු .
3. වර්තමානයේ **ස්ථාවර** දුරකතනවලට වඩා **ජංගම** දුරකතන ජනප්‍රිය වී ඇත .
4. **දුසිරිත්** ක්‍රියාවලින් ඈත් වී **සුසිරිත්** ක්‍රියා කොට ආදර්ශමත් විය යුතුයි .
5. **අහංකාර** ස්ත්‍රිය **නිරහංකාර** ස්ත්‍රිය දෙස රවා බැලුවා ය .
6. ජීවිතයේදී **අවශ්‍යය** දෑ ළඟ තබාගෙන **අනවශ්‍ය** දෑ ඉවත් කළ යුතුය.
7. **උත්තම** මිනිසුන් හමුවේ **අධම** මිනිස්සු කම්පාවට පත්වෙති .
8. ඕනෑම දෙයක සාර්ථක **ආරම්භය** සාර්ථක **අවසානය** පිළිබිඹු කරයි .
9. **මිතුරෙකුට** තබා **සතුරෙකුට** වත් මෙවැනි දුකක් අත් නොවේවා !
10. **බහුශ්‍රැත** මිනිසුන් මෙන්ම **අල්පශ්‍රැත** මිනිසුන් ද අප අතර සිටියි .